ලිංගික සේවා සපයන්නියන්/සපයන්නන් හැඳින්වීම උදෙසා තවමත් මාධ්‍ය තුළ නිතරම පාහේ භාවිතා වන යෙදුම වන්නේ "ගණිකාව" නැතිනම් "පිරිමි ගණිකාව" යන්නයි. මෙම යෙදුමෙහි පවතින ගැටළුව වන්නේ, "ගණිකාව" යන යෙදුම සමගින්, එම වෘත්තිය පිළිබඳව පවතින සමාජ ගර්හාවයි.

පහත පුවත් වාර්තාවන්, එසේ "ගණිකාව" යන යෙදුම භාවිතා වන ආකාරයට උදාහරණ වේ. (දිවයින 2022-02-04, ඉරිදා දිවයින 2022-02-06)

ඔබ සිතනා ලෙසට,

1) "ගණිකාව" යන යෙදුම දිගින් දිගටම භාවිතා වීම ඔස්සේ, ලිංගික ශ්‍රමිකයින් පිළිබඳව සමාජය තුළ පවතින ගර්හාව නොනැසී පවතින්නේ නොවේද? ඒ ඔස්සේ ඔවුන් සමාජයෙන් කොන් කිරීමකට ලක් නොවන්නේ ද?

2) ඒ අනුව බලන විට, "ගණිකාව" යන යෙදුම වෙනුවට, ලිංගික සේවා සපයන්නිය, ලිංගික ශ්‍රමිකයා වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේ ද?